# සන්නිවේදන

## ශාස්ත්‍රීය සංග්‍රහය තෙවන වෙළුම 2013

40th

1973 2013 Anniversary

Department of Mass Communication
University of Kelaniya- Sri Lanka

ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ

**සිව් දශක සැමරුම් කලාපය**



සහකාර කථිකාචාර්ය මංගල කීර්ති පැස්කුවල්
ජනසන්නිවේදන අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

# සිංහල මාධ්‍යයෙන් වෙබ් අඩවි භාවිතය හා සමාජ බලපෑම

**හැඳින්වීම**

ලෝකයේ වෙබ් අඩවි බිහිවීම සිදුවන්නේ 1990 දශකයේ මුල භාගයේදීය. CERN (The European Organization for Nuclear Research) ආයතනයේ සේවය කළ භෞතික විද්‍යාඥයෙකු ***Tim Berners-Lee*** ගේ සොයා ගැනීමක් වශයෙන් වෙබ් අඩවි සැලකිය හැකිය. 1980 දශකයේ කළ පර්යේෂණ රාශියක ප්‍රතිඵල ලෙස HTML හෙවත් අන්තර්ජාලය තුළ දත්ත ඇතුළත් කිරීමේ භාෂාවක් නිර්මාණය කර ගැනීම මෙහි මූලාරම්භය විය. ඒ යටතේ HTTP හෙවත් hyper text transfer protocol යන ක්‍රමවේදය භාවිතයෙන් ජාල අවකාශය තුළ යම් ඉඩක් භාවිත කරමින් අනන්‍ය ලිපිනයක් මඟින් වෙබ් අඩවියක් ඇරඹීමේ අවස්ථාව උදාවිය. WWW හෙවත් ලෝක ව්‍යාප්ත ජාලය ලෙස මෙය ලෝකයේ ජාලකරණයට ලක්වන ඕනෑම පරිගණකයක් ඔස්සේ නැරඹිය හැකි ආකාරයට නිර්මාණය විය. www.cern.info වෙබ් අඩවිය 1991 දි පළමු වෙබ් අඩවිය ලෙස නිර්මාණය විය.


පසුව ගෙවුණු වසර 23 ක කාලය තුළ ලෝකය පුරා වෙබ් අඩවි විශාල ප්‍රමාණයක් නිර්මාණය විය. ඒවා වඩා දියුණු ජාල භාෂා උපයෝගි කරගනිමින් විවිධ වර්ග යටතේ ජාලගත වී තිබෙන අයුරු දක්නට ලැබේ.

- සමාජ ජාල වෙබ් අඩවි
- ඡායාරූප වෙබ් අඩවි
- Reference වෙබ් අඩවි
- විඩියෝ අඩවි
- blog අඩවි

ආදි වශයෙන් ඒවා විවිධ ස්වරූපයෙන් දක්නට ලැබේ. මේ වන විට නිර්මාණය වී ඇති වෙබ් අඩවි ප්‍රමාණය ගණනින් ආසන්න වශයෙන් මිලියන 800 ක් පමණ වේ. නමුත් ක්‍රියාකාරීත්වයේ පවතින්නේ මිලියන 200 වැනි ප්‍රමාණයක් ය. ලංකාවේ වෙබ් අඩවි නිර්මාණය ආරම්භ වන්නේ 1995 වර්ෂයේදී පමණය. එය මුලින්ම Daily News, Sunday Times පුවත්පත් වල ජාලකරණයක් ලෙස සිදුවිය. පසුව 1996 දී රාජ්‍ය ආයතනවල ද වෙබ් අඩවි සැකසීම ආරම්භ විය. ඒ යටතේ රජයේ නිල වෙබ් අඩවිය ලෙස http://www.gov.lk ආරම්භ විය. ලංකාවේ වෙබ් අඩවි ව්‍යාප්තිය වඩා සීඝ්‍ර ලෙස ඉහල ගොස් ඇති අතර රජයේ දැනට ලියාපදිංචි ප්‍රවෘත්ති වෙබ් අඩවි පමණක් 59ක් තිබේ.

## වෙබ් අඩවිවල භාෂා විශේෂත්වය

ලෝකයේ භාෂා විශාල ප්‍රමාණයකින් වෙබ් අඩවි නිර්මාණය වී තිබේ. සමස්ත අන්තර්ජාල ප්‍රකාශනයෙන් 55% ක්ම ඉංග්‍රිසි භාෂාවෙන් පළවන වෙබ් අඩවි ය. ඊට අමතරව රුසියන්, ජර්මන්, ස්පාඤ්ඤ, චීන, ප්‍රංශ, ජපන්, අරාබි හා පෘතුග්‍රිසි භාෂා වෙබ් අඩවි බහුල වේ.




ලෝකයේ යම්කිසි රටක වෙබ් අඩවි රටේ මව් භාෂාවෙන් ප්‍රකාශයට පත්වීම ඒ රටේ සංවර්ධනය කෙබඳු ලෙස දායක වේද යන්න පසුගිය සමය තුළ ලෝකයේ ම කතා බහට ලක් වුවකි. unicode ක්‍රමය භාවිතයට එන්නේ ඒ අනුවය.

### Unicode යනු

පරිගණක මූලිකව අංක මගින් එහි කටයුතු සිදු කරයි. පරිගණක තුළ වචන හා අක්ෂර වලට නොයෙකුත් අංක නියම කොට ඒ අංක ගබඩා කිරිම මඟින් වචන හා අකුරු ද ගබඩා කර ගනියි. Unicode ක්‍රමය සොයා ගැනිමට පෙර මෙසේ අකුරු වලට අංක ගබඩා කිරිමට කේතන පද්ධති ඉතා විශාල ගණනක් පැවතුනි. උදාහරණයක් ලෙස යුරෝපීය සංගමයට පමණක් ඔවුන්ගේ භාෂා කේතන ක්‍රමරාශියක් අවශ්‍ය විය. එසේම එක් භාෂාවක් වන ඉංග්‍රිසි භාෂාව සඳහා එහි සියලු අක්ෂර, විරාම ලකුණු සහ තාක්ෂණික සංකේත සඳහා එක් කේතන ක්‍රමයක් නොසැහුනි. වෙනස් කේතන ක්‍රම කිහිපයක් සමඟ ක්‍රියා කළ යුතු විය. එහෙයින් දත්ත වෙනස් කේතන ක්‍රම හෝ පරිගණක පද්ධති හරහා ගමන් ගැනිමේදි කේතන ක්‍රම වල වෙනස හේතුවෙන් එම දත්ත විනාශ වීමට හෝ අපවිත්‍ර විමට ඉඩ ඇත. Unicode ක්‍රමය පරිගණක පද්ධතියෙන් ස්වායක්තව, පරිගණක වැඩසටහනෙන් ස්වායක්තව හා භාෂාවෙන් ස්වායක්තව සෑම අක්ෂරයකටම ඊටම අනන්‍ය වූ අංකයක් ලබාදේ. බොහෝ පරිගණක මෙහෙයුම් පද්ධතිවල සියලුම නවීන වෙබ් බවුසර සහ වෙනත් පරිගණක නිපැයුම් රාශියක් Unicode ක්‍රමය හා අනුකූල වේ. Unicode ප්‍රමිතිය භාවිත කිරීම සහ එයට සහය වන මෙවලම් ඇතිවීම මෑතකදී ඇති වූ ගෝලීය මෘදුකාංග තාක්ෂණ ප්‍රවණතා අතුරින් වඩාත්ම කැපී පෙනෙන විකාශනයකි. එය එකිනෙකට වෙනස් වූ බොහෝ පරිගණක පද්ධති හරහා දත්ත විනාශ වීමකින් හෝ අපවිත්‍ර වීමකින් තොරව දත්ත ප්‍රවාහනය කිරීමේ හැකියාව සපයයි. එමඟින් ඕනෑම රටක ඕනෑම භාෂාවක් අන්තර්ජාලය තුළ භාවිතකිරිමේ හැකියාව ලැබේ. Apple, HP, IBM,just system, Micro Soft, Oracle ආදි තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සමාගම් මෙම Unicode භාවිත ක්‍රියාත්මක කරති. එසේම නූතන මෘදුකාංග තුළද මෙම Unicode භාවිතයට පහසුකම් සලසා තිබේ. XML, Java, Java Script, PHP, WML වැනි නව වෙබ් අඩවි සකසන මෘදුකාංගමය භාෂා තුළද මෙම පහසුකම් සපයා තිබේ.

සිංහල Unicode පිළිබඳ 1980 දී පමණ පටන්ම DMS ආයතනය, මෙට්‍රොපොලිටන් ආයතනය ආදිය උනන්දු විය. පසුව විජය ග්‍රැෆික්ස් ආයතනය, ඇපල් ආයතනය ආදිය හඳුන්වා දුන් ක්‍රමවේද එකල පරිගණක වල භාවිත වුවත් ඒවා Unicode නොවිය. ලැප්ටොප් පරිගණක භාවිතයත් සමග Unicode අක්ෂර අවශ්‍යතාවය ඉහළ ගියේය. 1985 ශ්‍රී ලංකා පරිගණක හා තොරතුරු ක්‍රමවේද සභාව (Cintec) පිහිටුවා සිංහල හා දෙමළ භාෂා වලින් පරිගණක භාවිතය ගැන උනන්දු විය. ලෝකයේ බොහෝ රටවල භාවිත Unicode ක්‍රමයට අනුරූප ක්‍රමවේදයක් පිළිබඳ අවධානය යොමුවන්නේ 1997 වර්ෂයේදීය. ඒ කොළඹ සරසවිය හා සින්ටෙක් ආයතය එක්ව සැදූ ක්‍රමවේදය තුළිනි. මෙහිදී යතුරු පුවරුව ලෙස විජේසේකර යතුරු පුවරුව නම් කළේය. 1999 පත්කළ අන්තර්ජාල කමිටුව ගෙන ආ යෝජනාවක් වූයේ දේශීය අන්තර්ජාල භාවිතය අඩුවීමට හේතුව දේශිය භාෂාවලින් අන්තර්ජාල අන්තර්ගතයන් අඩු වීම බවයි.

**1999 පත්කළ අන්තර්ජාල කමිටුව**

1. ආචාර්ය ගිහාන් ඩයස්, ශ්‍රී ලංකාවේ වෙබ් වසම් නාම රෙජිස්ට්‍රාර් (.lk Domain name registrar - chair), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ ප්‍රධානී, පරිගණක විද්‍යා හා ඉංජිනේරු අංශය, මොරටුව විශ්වවිද්‍යාලය
2. මහාචාර්ය ජේ.බී. දිසානායක, සිංහල අංශය, කොළඹ විශ්වවිද්‍යාලය
3. අමරා නානායක්කාර මිය, පුස්තකාලාධිපතිනි, ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සභාව
4. ලලිත් ද සිල්වා මහතා, නියෝජ්‍ය මුද්‍රණාලයාධිපති, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
5. අභය අමරදාස මහතා, ප්‍රධානී, ලේක් හවුස් ආයතනය
6. අනුර තිසේරා මහතා, ආයතන ප්‍රධානී, ලේක් හවුස් ආයතනය
7. එච්. නවීන් ගුණරත්න මහතා, විජය ප්‍රකාශන
8. නිරංජන් මීගම්මන මහතා, ප්‍රධාන තාක්ෂණික, ඉෆියුෂන් ආයතනය
9. ආචාර්ය රුවන් වීරසිංහ මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනාංශය
10. හර්ෂ විජේවර්ධණ මහතා, උපදේශක, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනාංශය
11. පද්මා ජයවීර මිය, කොමසාරිස්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
12. අරුණි ගුණතිලක මිය, සහකාර අධ්‍යක්ෂිකා, සින්ටෙක් ආයතනය
13. මහාචාර්ය වී.කේ. සමරනායක, අධ්‍යක්ෂ, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනාංශය
14. එස්.ටී. නන්දසාර මහතා, සම්පන්ධිකරණ නිලධාරි, පරිගණක අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

2004 වන විට බිහිවන ඉස්කෝල පොත අද ද භාවිත මයිකෝසොෆ්ට් සමාගම නිපදවූ Unicode අකුරු වර්ගයයි. ඊට අමතරව කපුටා නමින්ද 2006 ඉෆියුෂන් සමාගම විසින් Unicode අකුරු වර්ගය ඉදිරිපත් කරන ලදි. 2004 බිහිවූ fronts.lk අකුරු පිළිබඳ පිහිටුවා ඇති මූලික වෙබ් අඩවිය ඉක්වා හෙවත් 2003 වසරේ පිහිටවූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මූලික වී භාෂා තුනට වෙන වෙනම www.siyabas.lk, www.locallanguages.lk හා www.emathumozhihal.lk වශයෙන් වෙබ් අඩවි තුනක් ආරම්භ කළේ ය. මේ ආකාරයෙන් සිංහල Unicode භාවිතයට යොමු වීම අන්තර්ජාල භාවිතා කිරීම පහසු වීමට හා ව්‍යාප්ත වීමට බලපෑවේය. Linux ලෙස බිහිවන පරිගණක මෙහෙයුම් පද්ධතිය සිංහල භාෂාවෙන් ද පවත්වාගෙන යන්නකි. මෙහි අත්වන වාසිය ඉංග්‍රිසි දැනුම නොමැති කෙනෙකුට වුව පරිගණකයේ වැඩ කිරීමට හා අන්තර්ජාලය හරහා තොරතුරු සෙවීම සිදුකළ හැකි වීමයි. නමුත් ශුද්ධ සිංහල වචන අන්තර්ජාල මෙහෙයුම් පද්ධති සෙවුම් පද්ධති වල තිබීම නිසා මතුවන ජාල සංකීර්ණ ලක්ෂණ යම් තරමක බාධාවකි.

උදා: බා ගත කිරීම, වියුණු සටහන

දැනට ලංකාවේ භාවිත Unicode අකුරු වර්ග ගණනාවකි.


- Malathi web font
- Kaputa Unicode
- Iskolapotha Unicode
- Kandy Unicode ඉන් සමහරකි.

## සිංහල වෙබ් අඩවි

මෙම Unicode භාවිතයෙන් ආරම්භ කර තිබෙන සිංහල වෙබ් අඩවි ද විශාල ප්‍රමාණයක් තිබේ. විශේෂයෙන් රාජ්‍ය ආයතන වෙබ් අඩවි විශේෂ වේ. ශ්‍රී ලංකා රජයේ නිල අන්තර්ජාල කිහිදොර, නැණසල, රාජ්‍ය සේවා කොමිසම් සභාව, ජාතික කෞතුකාගාරය, ටවර් හෝල් රඟහල පදනම ඒ අතරින් කිහිපයකි. මෙවැනි රාජ්‍ය ආයතන වලට Unicode භාවිත කිරීම පිළිබඳ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2007.04.04 වන දින ලිපියක් පළකර තිබේ. රාජ්‍ය ආයතන වල Unicode භාවිත කිරීම අනිවාර්ය කරමින් විවිධ අකුරු වර්ග භාවිත කිරීම ආයතන මට්ටමින් ගැටලු ඇති කරන බව මෙම ලිපිය මඟින් දක්වා තිබේ. රාජ්‍ය අංශය සඳහා වෙබ් අඩවි නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියක් 2004 වර්ෂයේ සිට රාජ්‍ය අන්තර් ජාල දත්ත මධ්‍යස්ථානය මඟින් ආරම්භ කළේය. රාජ්‍ය අංශයේ අඩවි 125ක් මෙම ව්‍යාපෘතිය තුළ දී නිර්මාණය කල අතර ඊට අමතරව දිස්ත්‍රික් මට්ටමින් හා පළාත මට්ටමින් ඇතිකළ වෙබ් අඩවි රාශියක් ද රාජ්‍ය අංශය සතුව තිබේ. මේවායේ ත්‍රයි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන අතර ඉහතින් දැක්වූ වෙබ් අඩවි වල සහයෝගයෙන් ඒ ඒ භාෂාවෙන් වෙබ් අඩවි කියවා ගැනීම පහසු වේ.

රාජ්‍ය අංශයේ තත්ත්වය එසේ වෙද්දී පෞද්ගලික අංශය සතු ව්‍යාපාර, කර්මාන්ත ආදියෙහි වෙබ් අඩවි වල තවමත් සිංහල මාධ්‍යයෙන් පළකිරීම තවමත් ප්‍රවණතාවයක් ලෙස වර්ධනය වී නොමැත. අන්තර්ජාල මාධ්‍යයෙන් ව්‍යාපාරයන් නිරත වන අය ඊට ආවේනික ලෙස වෙබ් අඩවි නිර්මාණය කරගෙන තිබේ. ඡායාරූප ශිල්පීන්, වාහන වෙන්දේසි කරන්නන්, වීඩියෝ ඡායාරූප ශිල්පීන්, නිරූපණ ශිල්පීන්, ගෘහ නිර්මාණ ශිල්පීන් ආදි පුද්ගලයින් හා කණ්ඩායම් වෙබ් මාධ්‍ය භාවිතා කරන බව පෙනේ. විශේෂයෙන් සමාජ ජාල වෙබ් අඩවි භාවිතයෙන් බොහෝ ව්‍යාපාරික ආයතන තම භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනයේ යෙදෙන බවක් දක්නට ඇත. එයිනුත් ලංකාවේ කැපී පෙනෙන සමාජ ජාල වෙබ් අඩවිය වන්නේ face book වෙබ් අඩවියයි. මිලියන 1. 5 කට වැඩි ප්‍රමාණයකට face book ගිණුම් පවතින බව අනාවරණය කර ගෙන තිබේ. linkin වැනි වෘත්තිමය සමාජ ජාල වෙබ් අඩවි ලංකාවේ තිබෙන්නේ ඉතා සුළු ප්‍රමාණයකි. එය මිලියන 0.3 ක් පමණ වේ. එවැනි වෙබ් අඩවියක අනිවාර්යෙන්ම ඉංග්‍රිසි භාෂාවෙන් වැඩකළ යුතු අතර ඉංග්‍රිසි උගත් මධ්‍යම පාන්තිකයන් අතර ක්‍රියාත්මක සමාජ ජාල වෙබ් අඩවියක් ලෙස linkin සැලකිය හැකිය. facebook වෙබ් අඩවිය තුළ සිංහල වචන භාවිතය ඉස්කෝල පොත, කපුටා වැනි යුනිකෝඩ් භාවිතා කරමින් සිදුකරන අතර නූතනය වන විට එය වඩාත් ජනප්‍රිය වෙබ් අඩවියක් වී තිබෙන්නේ මෙම සිංහල වචන භාවිතය නිසයි. පොදුවේ ගත් කල ලංකාවේ වඩාත් ජනප්‍රිය වෙබ් අඩවිය face book වෙබ් අඩවිය නිසාත් එය සමාජ ජාල වෙබ් අඩවියක් වන නිසාත් ඕනෑම සමාජ තරාතිරමක පුද්ගලයෙකුට මෙයට සම්බන්ධ වීමට හැකිවීම නිසාත් ඉන් ඇති කරන සමාජ බලපෑම අනෙක් සෑම වෙබ් අඩවියකටම වඩා ඉහල අගයක් ගනී.

ලෝකයේ පුද්ගලයින්ගෙන් මිලියන 845 පමණ දැනට ෆේස් බුක් භාවිත කරයි. ශ්‍රී ලාංකයින් භාවිතා කරන වෙබ් අඩවි අතරින් වැඩිම ඉල්ලුමක් ඇති වෙබ් අඩවිය වන්නේ ද ෆේස් බුක් වෙබ් අඩවියයි. ශ්‍රී ලංකාවේ මිලියන 21 ක වූ ජනගහනයෙන් 5.7% කට ෆේස් බුක් ගිණුම් තිබෙන බව දත්ත වාර්තාවල දැක්වේ. එයින් 67% පිරිමින් වන අතර කාන්තා ප්‍රතිශතය 33% කි.




මිනිසුන් තමන්ගේ පෞද්ගලික තොරතුරු හා ඡායාරූප තම ව්‍යාපාරික වෘත්තීය තොරතුරු, විවිධ ඉසව් අවස්ථා පිළිබඳ තොරතුරු අන්තර්ජාලයට මුදා හරින සරලම ක්‍රමය face book upload කිරීමයි. ප්‍රතිචාර දැක්වීමේ හැකියාව, හුවමාරු කිරීමේ හැකියාව කැමති අකමැති බව දැක්වීම ආදි ප්‍රති පෝෂණයට අවශ්‍ය කරන තත්ත්වයන් රැසක් මෙම වෙබ් අඩවිය සතුව තිබීමත් එය සිංහල මාධ්‍යයෙන් පළකළ හැකි වීමත් facebook භාවිතය ජනප්‍රිය වීමට හේතු වී තිබේ.

විවිධ වෘත්තිකයන් එකතුවීම නිසා facebook තම ව්‍යාපාර සේවා භාණ්ඩ ප්‍රවර්ධන මාධ්‍යක් ලෙසට ලංකාවේ භාවිතා කිරීම ඉහළ යමින් තිබෙන බව පෙනෙන සත්‍යකි. ව්‍යාපාරික පමණක් නොව facebook විනෝදාස්වාදන මාධ්‍යක් ලෙස ද මිනිසුන්ගේ කාලය විනාශ කරන අයුරු බොහෝ ආයතන, දෙපාර්තමේන්තු ආදිය නිරීක්ෂණය තුළින් පැහැදිලි වේ. මේ දිනවල facebook භාවිතය තහනම් කිරීම පිළිබඳව සමාජ කතිකාවක් නිර්මාණය වී තිබෙන්නේ ද මෙහි ප්‍රතිඵලයක් වශයෙනි. බොහෝ සංස්ථා, දෙපාර්තමේන්තු, මණ්ඩලවල සියළුම ශ්‍රේණි වල වෘත්තිකයන් facebook භාවිතයට ඇබ්බැහි වී තිබීම මීට හේතුවයි. ඔවුන් වැඩකරන මිනිස් පැය ප්‍රමාණය අපතේ හරිමින් facebook හරහා විනෝද වීමට කාලය ගන්නා බව දිගින් දිගටම ආයතන පරිපාලනයට අවබෝධ වෙමින් තිබෙන බවත් බොහෝ පරිපාලකයන්ගේ චෝදනාවයි. විශාල ඡායාරූප ප්‍රමාණයක් විශාල නිර්මාණාත්මක ඉදිරිපත් කිරීම් ප්‍රමාණයක් ඉතාමත් කෙටි කාලයක් තුළ facebook ඇසුරෙන් ජාලකරණයට ලක් වේ. පසුගිය සමයේ වූ රතු පස්වල සිද්ධිය, බෝවත්තේ ඉන්ද්‍රරතන හිමි ගේ සිය දිවි නසා ගැනීම ආදිය පිළිබඳ විශාල කතිකාවක් නිර්මාණය වූයේ facebook වෙබ් අඩවි තුළයි. මෙම සිදුවීම් දෙක සිදු වූ මාස දෙක තුළ ඒ සිදුවීම් හා සම්බන්ධ ඡායාරූප, වීඩියෝ දර්ශන, පුවත්පත් උපුටා ගැනීම් facebook වෙබ් අඩවි තුළ දක්නට ලැබුණු අතර විශාල මතවාදයක් නිර්මාණය වීමට අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම් ප්‍රමාණයක් ද ඒවාට ලැබී තිබේ. මෙම මාධ්‍යයේ තිබෙන තවත් විශේෂත්වයක් වන්නේ පුවත් උපුටා ගැනීම වැනි වෙනත් මාධ්‍යයක තොරතුරු එම ස්වාභාවයෙන්ම මේ තුළ ඇතුලත් කළ හැකිවීම  වීමයි. මෙය එක් කෝණයකින් බලද්දී දැනුම තොරතුරු හුවමාරු වන වඩාත් සක්‍රීය ක්‍රමයකි. දේශපාලන විවේචනය මතවාද වලට ඇති වේදිකාවකි. සැමරුම් අවස්ථා, අමතක වුණු දත්ත නැවත නැවත මෙනෙහි කරන ක්‍රියාවලියකි. විවිධ රෝග චර්යා පිළබඳව දැනුවත් කරන මාර්ගෝපදේශකත්වයකි. ඒ අර්ථයෙන් ගත් කල facebook සිංහල භාෂාවෙන් ක්‍රියාත්මක කිරීම විශාල සමාජ බලපෑමක් ඇතිකිරීමට හේතුවක් වෙයි.

Facebook භාවිතා කිරීම  බහුලව භාවිත කරන Desktop හෝ Laptop පරිගණක වලට අමතරව නූතනයේ බොහෝ දෙනා අතර පවතින Smart Mobile Phone ඔස්සේ වඩා පහසුවෙන් පැහැදිලි ලෙස Face Book වෙතපිවිසීමේ හැකියාව තිබීම සාමාන්‍ය ජනතාව අතර facebook ජනප්‍රිය වීමට හේතු වී තිබේ. ඉහත කී සිංහල මාධ්‍යකරණය වඩාත් සාර්ථක වී තිබෙන බවට හොඳම උදාහරණය  facebook බව මින් තහවුරු වේ. නමුත් facebook යනු ඒකභාෂිත වෙබ් අඩවියක් නොවේ. එහි මූලික ස්වරූපය ඉංග්‍රිසි භාෂාවෙන් සැකසී තිබීම විශේෂත්වයකි.

Blog සන්නිවේදනය ද අන්තර්ජාලය තුළ බිහිවූ ඉතා නූතන සහ වඩාත් ජනප්‍රිය ආකෘතියක් ලෙස විග්‍රාහ කිරිම වටී. Blog යන්න Web Blog යන්නෙන් බිඳී ආ වචනයකි. Web අඩවියක් යන්න ග්‍රන්ථයක් ලෙස සැලකුවහොත් Blog අඩවියක් යනු දිනපොතකැයි යන්න පරිගණක විද්වතුන්ගේ අදහසයි. බොහෝ විට Blog අඩවියක් Web අඩවියක් තරම් සංකීර්ණ හා විසිරුණු බවකින් යුක්ත නොවේ. එහි දක්නට ලැබෙන්නේ තනි පුද්ගල හෝ පුද්ගල කණ්ඩායමක් තම අදහසක් මතයක් ජාලගත කර තිබෙන තනි පිටුවකින් හෝ පිටු කිහිපයකින් යුක්ත Web අවකාශයකි. මෙවැනි Web අඩවි ව්‍යාපාරික හෝ රාජ්‍ය මට්ටමට අවශ්‍ය වන්නේ නැත. විකල්ප අදහස් දරන සුළුතර නියෝජනයන්, කලාව, සාහිත්‍යය ආදියට අනන්‍ය වූ Blog අඩවි ලෝකයේ සෑම රටකම පාහේ තිබේ. Blog අඩවියක් නිර්මාණය කරන්නෙකුට බොහෝ විට එය තම මව් භාෂාවෙන් පළකරන්නට හැකියාවක් තිබේ නම් ඒ ගැන වඩාත් උනන්දු වේ. ඊටහේතුව වන්නේ බොහෝ විට Blog අඩවියක් තුළින් මුලින් සඳහන් කළ පරිදිම මතවාද, අදහස්, ප්‍රතිචාර දැක්වීම මූලික අරමුණක් වන නිසා එය වඩාත් පහසුවෙන් මව් භාෂාව යොදා ගැනීම මඟින් සිදුකළ හැකිබව විශ්වාස කරයි. උදා:- සිංහල Blog කරුවන්ගේ සංගමය නමින් ලංකාවේ ඇති කර ගෙන තිබෙන Blog එකතුවේ සාමාජිකත්වය දරන Blog අඩවි 800 පමණ කි. kottu.org Blog එකතුව Blog අඩවි 1450කින් යුක්තය. මේ සියලු Blog අඩවි දේශිය වෙබ් අඩවි වන අතර 90% සිංහල භාෂාවෙන් තිබිම විශේෂත්වයයි. ඒවා විවිධ මාතෘකා යටතේ වේ. විකල්ප බ්ලොග් අඩවිය පුරවැසි මාධ්‍යවේදය කෙරෙහි උනන්දුවන පොදු ජනයාගේ පුවත් එළිදක්වන බ්ලොග් අඩවියකි.

Blogspot.com,bloger.com,WordPress.com ආදිවෙබ් අඩවි හරහා සපයන Blog අඩවි නිර්මාණය කිරිමේ ඉඩ ප්‍රස්තාව ලංකාවේ විශාල Blog අඩවි ප්‍රමාණයක් නිර්මාණය වීමට බලපා තිබේ. ලංකාවේ Blog අඩවි වල විවිධ මාතෘකා දක්නට ලැබේ. කවි, විචාර, චිත්‍රපට පිළිබඳ විස්තර, ඕපාදූප, දේශපාලන අදහස් හා ජනප්‍රිය මාතෘකා ඒ අතර වෙයි. බයිස්කෝප් සිංහලෙන් නැමති Blog අඩවිය ලංකාවේ වඩාත් ජනප්‍රිය වී තිබෙන්නේ බාගත කරනු ලබන වෙනත් භාෂාවලින් යුතු චිත්‍රපට වලට සිංහල උපසිරැසින් යෙදීම මෙම Blog අඩවි හරහා සිදු කිරිම නිසයි. මෙම Blog අඩවිය සඳහා පිවිසෙන ග්‍රාහකයින් සංඛ්‍යාත්මකව දත්තයන් සේ රැස්කරගැනිමේ හැකියාවක් Blog අඩවිවල තිබෙන නිසා විශාල පිරිසක් ලංකාවේ සිංහල Web අඩවි වලට පිවිසෙන බව අනාවරණය කර ගත හැකිය. Blog අඩවි ඔස්සේ ප්‍රතිචාර දැක්වීම වඩාත් සක්‍රිය තත්ත්වයක පවතී. ලංකාවේ වඩාත් සක්‍රීය Blog අඩවියක් ලෙස ගොසිප් ලංකා වෙබ් අඩවිය වඩාත් ප්‍රසිද්ධ වී ඇත්තේ ඒහි සාමාන්‍ය මිනිසුන් ප්‍රිය කරන සිදුවීම් හා ප්‍රවෘත්ති වලින් සමන්විත වන නිසයි. එය ලංකාදීප වැනි පුවත්පත් වෙබ් අඩවියකට පවා අභියෝගයක් වන පරිදි නිර්මාණය කර තිබෙන අවස්ථා නිරීක්ෂණය කිරිමේදි පෙනේ.

අපේ රටේ තිබෙන ව්‍යාපාරික Web අඩවි ඉංග්‍රිසි භාෂාවෙන් හැර සිංහල භාෂාවෙන් පළකල නොහැක්කේ එහි තිබෙන ව්‍යාපාරික වටිනාකම් හා එහි ක්‍රියාකාරිත්වයට විශේෂ වාසියක් භාෂාවෙන් අත්වෙනවා යැයි ඔවුන් නොසිතන නිසාය. උදා:- Dialog සමාගම තම Web අඩවිය සිංහල මාධ්‍යයෙන් පළකිරිම හෝ සංචාරක හෝටල් වල වෙබ් අඩවි උදාහරණයක් සේ දැක්විය හැකිය. නමුත් Dialog පාරිභෝගිකයා දිගින් දිගටම තම ව්‍යාපාරික සීමාවේ රඳවා ගැනිමට Dialog ආයතනය සිංගිලිෂ් භාවිතයට ජංගම දුරකථන වලට එවන SMS වලදී ක්‍රියාත්මක කරන බව පෙනේ. තව නොබෝ දිනකින් ඔවුන්ගේ අවශ්‍යතාවය මත සිංහල මාධ්‍යයෙන්ද වෙබ් අඩවි පළවීමේ ප්‍රවණතාවයක් ඇතිවී තිබේ.

සිංහල මාධ්‍යයෙන් වෙබ් අඩවි පළකිරිම පිළිබඳ වඩාත් සුවිශේෂිත්වයක් මාධ්‍ය වෙබ් අඩවි ආශ්‍රයෙන් දක්නට ලැබේ. අන්තර්ජාල වෙබ් අඩවි වල පුවත්පත් විශාල ප්‍රමාණයක් ලංකාවේ දක්නට ඇත. ලංකාදීප, දිවයින, දිනමිණ, ලක්බිම ආදි ජාතික පුවත්පත් සියල්ල ම පාහේ ජාලකරණයට ලක්ව තිබේ. ඒවායින් වඩාත් ප්‍රසිද්ධ ජාල පුවත්පත වන්නේ ලංකාදීප පුවත්පතයි. E පේපර් හෙවත් මුද්‍රිත ප්‍රකාශයක් ලෙස පළකරනු ලබන පුවත්පතට අන්තර්ජාලය තුළ දක්නට ලැබුනත් වඩාත් ආකර්ෂණිය වන්නේ ජාල පුවත්පත් ලෙස හඳුන්වන ජාලයට අනුකූලව සැකසූ සංස්කරණයයි. අනෙක් පුවත්පත් වලට සාපේක්ෂව ලංකාදීප පුවත්පතේ ජාල සංස්කරණය ජනතාව අතර ප්‍රසිද්ධය. ඊට බලපා තිබෙන්නේ යාවත්කාලීන කිරිම වඩා වේගවත් වීමත් ප්‍රාදේශිය පුවත් ආදියට ඉඩක් ලබා දීමත් ය. සිංහල මාධ්‍ය පුවත්පත ජාලය තුළින් නැරඹිම මිනිසුන් වඩාත් උනන්දුවන කරුණක්

ලෙස සැලකිය හැක්කේ ලංකාදිප පුවත්පතට දක්වා තිබෙන ප්‍රතිචාර දැක්වීම සැලකිල්ලට ගැනිමේදී ය. ජාල පුවත්පත් අතරින් වැඩිම ප්‍රතිචාර දැක්වීම තිබෙන්නේ ලංකාදීප පුවත්පතටයි. දිවයින, ලක්බිම ආදි පුවත්පත් යාවත්කාලින වීම ප්‍රමාදවන බවක් පෙනෙන්නට තිබෙන තත්ත්වයකි.

දිවයින පුවත්පතේ ජාලකරණය යම්තාක් දුරට මිනිසුන් අතර ජනප්‍රිය වන බවක් ප්‍රතිචාර දැක්වීම හා නරඹන්නන් සංඛ්‍යාව අධ්‍යයනයෙන් පැහැදිලි වේ. ජාතික පුවත්පත් හැරුණු විට ජාලයට විශේෂ වූ පුවත් වෙබ් අඩවි ගණනාවක් ජාලයේ වේ. Lanka Enews, mirror සහ පසුගිය සමයේ තහනම් වූ ප්‍රවෘත්ති වෙබ් අඩවි ගනණාවක්ම මිනිසුන් අතර යම්තාක් දුරට ජනප්‍රිය වූ සිංහල සංස්කරණයන් සහිත වෙබ් අඩවි වේ. Gosip ලංකා, Gosip 9 වැනි Blog අඩවි ද ප්‍රවෘත්ති සැපයිමේ කාර්යයේදි යම් මෙහෙවරක් කරන බව හඳුනාගත හැකිය. ජාතික පුවත්පත් හෝ මෙවැනි ප්‍රවෘත්තිමය web අඩවි නොවන පුවත්පත් යම් ප්‍රමාණයක් ද ජාල සංස්කරණයන් ලෙස සිංහල මාධ්‍යයෙන් පළවේ. ඒවායේ ආචාරධර්ම ගැටලු තිබේ. රජය මඟින් පවත්වාගෙන යන ප්‍රවෘත්ති web අඩවි කිහිපයක් ද තිබේ. News.lk හෙවත් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු web අඩවිය මෙහිදී විශේෂ වේ. එවැනි වෙබ් අඩවි මඟින් ප්‍රවෘත්තියක නිලභාවයද තහවුරු කර ඇත. මෙම web අඩවිය භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වි ඇති ප්‍රවෘත්ති වෙබ් අඩවි සංඛ්‍යාව 59කි. ඒ අතරිනුත් සිංහල මාධ්‍යයෙන් 80% ක වෙබ් අඩවි තිබෙන බව දත්ත වාර්තා පෙන්වා දෙයි. ඉහත කි ප්‍රවෘත්ති වෙබ් අඩවි අතර පුවත්පත් හැරුණු විට හිරු ප්‍රවෘත්ති, අද දෙරන ආදි විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්ති පිළිබඳ ජාල ආවරණයක් ද වේ. ලංකාවේ වෙබ් අඩවි විටෙක පුවත්පත් මාධ්‍යය ලක්ෂණ ගනියි. ඉන් අදහස් කරන්නේ අපේ රටේ ඉහල මධ්‍යම පාන්තිකයන් ඉංග්‍රිසි පුවත්පත් කියවනවාසේම සිංහල පුවත්පත් කියවන්නේ සාමාන්‍ය ජනතාවය. වෙබ් අඩවි වලද තත්වය එසේමය. සිංහල වෙබ් අඩවි බොහෝමයක් සාමාන්‍ය පාඨකයා පරිශිලනය කරයි.

සිංහල මාධ්‍ය වෙබ් අඩවි සැලකීමේදි විනෝදාස්වාදන වෙබ් අඩවි ද විශාල ප්‍රමාණයක් තිබෙන බව හඳුනාගත හැකිය. ඉහතින් දැක්වූ Blog අඩවි බොහෝමයකම විනෝදාස්වාදන ලක්ෂණ දකිය හැකිය. සිංහල මාධ්‍ය ලෙස text එපමණක් නොව හිඩ භාවිතයද විශේෂිත වේ. ගීත ඇතුළත් වෙබ් අඩවි, විවිධ කතාන්දර, කෙටිකතා, කාටුන් ආදි ඇතුළත් Blog අඩවි, Face Book වෙබ් අඩවිය චිත්‍රපට ආදිය ඇතුළත් වෙබ් අඩවි, You Tube නැමති වෙබ් අඩවිය ද විනෝදය සඳහා මිනිසුන් ඇසුරු කරන වෙබ් වලට උදාහරණයන් ය. You Tube යනු දේශිය වෙබ් අඩවියක් නොවේ. එය විදෙස් වෙබ් අඩවියකි. නමුත් ඕනැම කෙනෙකුට ගිණුමක් භාවිත කර අපි කැමති විඩියෝවක් ඊට ඇතුලත් කර ගැනිමට හැකියාව තිබේ. ලංකාවේ පැරණි සිංහල චිත්‍රපට චිත්‍රපට ගී, ගීත ඇසුරෙන් නිර්මාණය වන දෘශ්‍ය පට බෙහෝමයක් You Tube තුළ අන්තර්ගත වේ. එහි භාෂාව ප්‍රශ්නයක් වන්නේ නැත. නමුත් යුනිකෝඩ් භාවිතයත් සමඟ වඩාත් පහසුවෙන් තමාට අවශ්‍ය තෝරා ගැනිම සිංහල මාධ්‍යයෙන් කර ගැනිමට පහසුකම් සැලසී තිබේ. එසේ නොමැතිව වුවත් ලංකාවේ සිංග්ලිෂ් භාවිතය බොහෝ දෙනෙකුට පහසුවෙන් කළහැකි තත්වයක් නිර්මාණය වී තිබිම නිසා මෙවැනි තෝරා ගැනිම් අවස්ථාවක එය යොදා ගනී. ඊට හුරුව ලැබි තිබෙන්නේ SMS භාවිතයෙනි. තවමත් අපි SMS භාවිතයේදි සිංහල මාධ්‍ය භාවිතා නොකරති. නමුත් E mail යැවීම සිංහල මාධ්‍යයෙන් සිදුකරන තත්ත්වයකට පැමිණ තිබේ.

සිංහල වෙබ් අඩවි කිහිපයක් 2011 වර්ෂයේදි මැදපෙරදිග කලාපයේ තහනමට ලක්විය. මුස්ලිම් ආගමට අපහාසවන ලෙස ලිපිපළකර තිබීම තහනමට හේතුවයි. sinhalabuddhist.com sinhalarawaya.com peramunerala.wordpress.com ආදි වෙබ් අඩවි මෙසේ තහනම් විය.වෙබ් අඩවි තහනම සිංහල මාධ්‍ය වෙබ් අඩවි වලට බලපාන්නේ කෙසේද යන්නද විමසා බැලිය යුත්තකි. පොදු වෙබ් අඩවි වර්ගීකරණය තුළ සිදුවන අන්දමට ලංකාවේ ද pornography වෙබ් අඩවි බහුල විමක් දක්නට තිබේ. සිංහල මාධ්‍යයෙන් බ්ලොග් අඩවි පළකිරිම තුළ මේ තත්වය ඉහල ගොස් තිබේ. බ්ලොග් අඩවියක් ආරම්භ කිරිම ඉතාම සරල ක්‍රියාවලියකි. wordpress.com හෝ blogspot.com වෙබ් අඩවි හරහා එම පහසුකම් සලසා තිබේ. ලංකාවේ පෙර පැවතුන අශ්ලීල පුවත්පත් අද වෙබ් මාධ්‍යයෙන් පළ වේ. ඒවා අන්තර්ජාල සංස්කරණයක් ලෙස සැකසී ඇත. welakatha ලේබලය යටතේ පමණක් 100කට අධික වෙබ් අඩවි ප්‍රමාණයක් අන්තර්ජාලය තුළ වෙයි. යාවත්කාලින වීම, ප්‍රතිචාර දැක්වීම ඉහල අගයක් ගැනීම යන හේතු මත සිංහල වෙබ් අඩවි අතර ප්‍රවෘත්ති වෙබ් අඩවි තරමට මේවා ප්‍රසිද්ධ වී තිබේ. welakathasinhala.blogspot.com blog අඩවියේ පමණක් 2013 කතා පිටු පමණක් 233 ඇතුලත්වේ.

2013 - 233 (2013/10/20 දිනට )

2012 - 175

2011 - 23

2010 - 1

Srisinhalawelakatha

2013 - 46

2012 - 1

ඉහත බ්ලොග් අඩවි කිසිවක් කිසිදු බ්ලොග් කියවනයකට ඇතුළත් කර නැත. ඊට හේතුව සිංහල blog වල තිබෙන ප්‍රමිතීන් වලට මෙම blog අඩවි යටත් නොවන නිසයි. අන්තර්ජාල සම්බන්ධතා (host name) 9552 ත් 2012 වර්ෂය අවසන් වන විට ලංකාවේ ස්ථාපිත වී තිබුනි.මිලියන 5 කට ආසන්න පිරිසක් අන්තර් ජාලය හා එක්වන බව TRC දත්ත වාර්තා පෙන්වා දෙයි. XSLG වෙබ් අඩවිය විශාල වශයෙන් අශ්ලීල ප්‍රකාශන සිංහල මාධ්‍යයෙන් පළකරන බ්ලොග් අඩවියක් වන අතර එම වෙබ් අඩවියට පිවිසෙන්නන්ගෙන් 81% ලාංකිකයන්ය. ඊට අමතරව වෙනත් රටවලට ගොස් සිටින ලාංකිකයින්ද මෙම කතා කියවන බව සංඛ්‍යාලේඛන වලින් පෙන්වා දෙයි. මසකට මිලියන 0.1 පමණ පිරිසක් මෙම වෙබ් අඩවියට පිවිසෙන බවද එම දත්ත වල වෙයි. මෙහිදී එක් අයෙකු නැවත නැවත බ්ලොග් අඩවියට පිවිසියද එය ගණනය වන නිසා නරඹන්නන් ලෙස එය අර්ථ දැක්වීම නිවැරදි නොවුනත් සංඛ්‍යාත්මක විශාල අගයක් එය නරඹන බවත් ඉන් තහවුරු වෙයි. මෙවැනි වෙබ් අඩවි වල තිබෙන තවත් විශේෂත්වයක් වන්නේ links හෙවත් සම්බන්ධතා බහුල වීමයි. උදාහරණයක් ලෙස welakatha නමින් වන facebook පිටුව මගින් තවත් පිටු විශාල සංඛ්‍යාවකට සම්බන්ධතා සකසා තිබේ. ඒවා සිංහල මාධ්‍ය වෙබ් අඩවි පමණක් නොව වෙනත් භාෂා (විශේෂයෙන් ඉංග්‍රිසි) වලින් පළවන වීඩියෝ, ඡායාරූප ආදිය ඇතුලත් වෙබ් අඩවි සමඟ ද සම්බන්ධ කර තිබේ.සිංහල මාධ්‍යයෙන් welakatha ලේබලය යටතේ පමණක් ඇති වෙබ් අඩවි විශාල පිරිසක් නැරඹීම සමාජ ගැටලුවලට හේතු සාධක විය හැකිය. එම කතා පුද්ගලභාවයට කරන බලපෑම රූප හෝ වීඩියෝ වලට වඩා ප්‍රබල විය හැක්කේ ලියමනක් තුළ පරිකල්පනය ගැබ් වන නිසයි. විවිධ වර්ගයේ කතා පළවීම, එය සමාජයට නිරාවරණය නොවී තිබීම, නියාමනය කිරීමේ හැකියාව අවම වීම නිසා මෙමඟින් ඇති කරන බලපෑම අහිතකර ය.

සිංහල මාධ්‍යයෙන් වෙබ් අඩවි සකසා ගැනීම පිළිබඳ ප්‍රශ්නකාරී බවක් විවිධ පරිගණක වල නිර්මාණය වී තිබේ. OC හෙවත් මෙහෙයුම් පද්ධතිය මීට බලපාන බව තේරුම්ගත යුතුය. අනෙක් කරුණ භාෂා තුනේම වෙබ් අඩවි සැකසීමේදී XML ජාල භාෂාව භාවිතයට ගත යුතුය.වෙබ් අඩවිය HTML වලින් සකසා ඊට අකුරු XML තුළින් සැකසූ විට ඊට සිංහල Unicode ඇතුලත් කිරීමේ හැකියාව ලැබේ.

පොදුවේ ගත් කළ සිංහල මාධ්‍යයෙන් වෙබ් අඩවි පළ කිරීම විවිධ මතයන් නිර්මාණය කරමින් තිබේ. දශක තුනකට පමණ පෙර ආරම්භ වන ලෝක ව්‍යාප්ත ජාලය තුළ විවිධ භාෂා වලින් වෙබ් අඩවි පළවුවත් ඕනෑම රටක් තම රටේ මව් භාෂාවෙන් වෙබ් අඩවි පළ කිරීමට යොමු වීම සාර සන්නිවේදනයකට මග හෙළිකරන්නකි. ලංකාව වැනි රටක දමිළ භාෂාව තවමත් සිංහල මාධ්‍ය තරමටම ජාලකරණයකට ලක්ව නොතිබේ. විශේෂයෙන් රාජ්‍ය අංශයේ වෙබ් අඩවි වල සේවා සාමාන්‍ය පාඨකත්වය කරා ගෙනයාමේ දි නවමාධ්‍ය තුළ සිංහල මාධ්‍යය කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය තත්ත්වයකි. මක්නිසාද ඉංග්‍රිසි අපගේ ජාතික භාෂාව නොවන නිසාත් තවමත් බොහෝ රාජකාරි ලියවිලි සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පළවන නිසාත් ය. උදාහරණයක් ලෙස,

- උපත් ලියාපදිංචි කිරීම
- මරණ ලියාපදිංචි කිරීම
- ජාතික හැඳුනුම්පත් සකස් කිරීම

ආදි අවස්ථාවක අන්තර්ජාලය ඔස්සේ පහසුකම් සපයා ගැනීමට සිංහල මාධ්‍ය අන්තර්ජාලය තුළ භාවිත කිරීමේ පහසුවක් තිබීම අත්‍යාවශ්‍ය තත්ත්වයකි. රටේ බහුතර ප්‍රජාව තවමත් ඉංග්‍රිසි

සාක්ෂරතාවය අල්ප නිසාත් සාමාන්‍ය මිනිසුන් ට අවශ්‍ය තොරතුරු, දැනුම විසරණය වීමට නවමාධ්‍ය තුළ සිංහල භාෂාවෙන් ලිපි පළකිරීම සිදු කර ගැනීමට හැකිවීම පහසුකමකි. Sinhala Unicode නිර්මාණය කර ගැනීමට හැකිවීමත් ඒ ඔස්සේ වඩාත් වේගයෙන් වෙබ් අවකාශය තුළ සිංහල මාධ්‍ය ලිපි පළකිරීම ඉහල යාමත් සිදුව තිබීමෙන් ඒ බව සනාථ වේ. අනෙක් කරුණ මාධ්‍ය විෂය තුළ අප හඳුනාගන්නා ප්‍රතිපෝෂණයකට අවශ්‍ය කරන ප්‍රතිචාර දැක්වීම වඩාත් සක්‍රිය වන්නේ මව්භාෂාවෙන් ජාල මාධ්‍යය තුළ හැසිරීමට ඉඩකඩ ලැබීම තුළයි. සිංහල Unicode භාවිතයට ප්‍රථම සිංග්ලිෂ් නමින් සිංහල උච්චාරණය සහිත ඉංග්‍රිසි අක්ෂර භාවිත කිරිමේ ක්‍රමය ප්‍රචලිතව පැවතුණි. එය SMS හෙවත් කෙටි පණිවිඩ ක්‍රමය හරහා ලැබුණු දෙයකි. කෙසේ වුවත් ඊට වඩා සක්‍රිය ලෙස Unicode හරහා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය වර්තමානයේ සිදුවේ. පසුගිය සමයේ සිදුවූ විශේෂ සිද්ධි සම්බන්ධයෙන් Face Book වැනි සමාජ ජාල වල මෙන්ම බොහෝ බ්ලොග් අඩවි තුළද පළවූ ලිපි හා ඊට ප්‍රතිචාර දැක්වීම් මතවාද ආදිය සක්‍රිය මට්ටමක පැවතුණ බව පෙනෙන්නට තිබෙන තත්ත්වයකි. රටේ ජනගහනයට වඩා දුරකථන තිබෙන ලංකාවේ mobile Phone සංඛ්‍යාව විශාල අගයක් ගනි. එයින් වර්තමානයේ තිබෙන smart phone වලින් ජාල පහසුකම පෙරට වඩා වර්ධනය වී තිබේ. mobile facebook භාවිත කිරීම ඒ අනුව සීඝ්‍රයෙන් ඉහල යයි. face Book පමණක් නොව බ්ලොග් අඩවිද නැරඹීම ජංගම දුරකථන ඔස්සේ සිදුකරන තත්වයට ලංකාවේ තොරතුරු තාක්ෂණය වර්ධනය වෙමින් තිබේ.

## සමාලෝචනය

මේ සියලු තත්ත්වයන් තුළ අන්තර්ජාලය ලංකාවේ ජනප්‍රිය ප්‍රවණතාවයක් ව තිබෙන බව පැහැදිලිය. එයට සිංහල මාධ්‍ය ජාලකරණය සක්‍රිය බලපෑමක් කරන අතර ලංකාවේ අන්තර්ජාල භාවිතය ඉහල යාමට එය හේතු වී තිබෙන බවක් ද පෙන්නුම් කරයි. නමුත් රාජ්‍ය අංශයේ සිංහල මාධ්‍ය වෙබ් අඩවි තවමත් ක්‍රියාකාරි යමක් සිදුනොකරන බව එම වෙබ් අඩවි වලට පිවිසිමෙන් මෙන්ම ගණනය කිරිමේ (Rating) සටහන් වලින් ද ඔප්පු වේ. බ්ලොග් අඩවි හා Face book හරහා විකල්ප මතවාද, කලාව, සාහිත්‍ය වර්ධනය වන බවක් පෙනි යයි. Pornography වර්ධනයත් මේ හරහා ම සිදුවන බව කිව යුතුමය. සිංහල වෙබ් කිහිපයකි. සිංහල බ්ලොග් අඩවි 3000 පමණ බ්ලොග් අඩවි එකතුන් (Blog portal) තුළ පමණක් තිබේ. මීට අමතරව බ්ලොග් අඩවි එකතුවකට සම්බන්ධ නොවුණු බ්ලොග් අඩවි ද විශාල ප්‍රමාණයක් ඇත. අශ්ශීල ප්‍රකාශන බ්ලොග් අඩවි අයත් වන්නේ එම ගණයටය. මෙම බ්ලොග් අඩවිවලට විශාල පිරිසක් සම්බන්ධ වන බවක් සංඛ්‍යා දත්ත පෙන්වා දෙයි. එහිදි බයිස්කෝප් සිංහල, gossip lanka වැනි වෙබ් අඩවි වල ජනප්‍රියතාවය ඒවායේ face book සම්බන්ධතා ප්‍රමාණයෙන් ඔප්පු වේ. wela katha ලේබලය යටතේ එන අශ්ලීල ප්‍රකාශන බොහෝ පිරිසක් කියවන අතර එය 2013 වර්ෂය වන විට ඉහළ ගොස් තිබෙන බවද පෙනි යයි. නියාමනය සඳහා විවිධ අවස්ථා වල පියවර ගෙන තිබුණත් සෑම මොහොතකම අලුතින් නිර්මාණය කිරිමේ හැකියාව ඇති නිසා තවමත් ලංකාවේ වෙබ් අඩවි කෙරෙහි පැහැදිලි නියාමන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවේ. සිංහල වෙබ් අඩවි සඳහා භාෂා සාධකය මුලික කරගත් නියාමන ක්‍රමයක් සැකසීම අවශ්‍ය බව අශ්ලීල ප්‍රකාශන වෙබ් අඩවි අධ්‍යයනයෙන් පැහැදිලි වේ. රටක මව් භාෂාව වෙනත් කිසිඳු භාෂාවකට වඩා සක්‍රිය ලෙස සන්නිවේදනය සඳහා යොදා ගත හැකි නිසා වෙබ් අඩවි සිංහල මාධ්‍යයෙන් පළකිරීම හොඳ නරක කෙසේ වුවද සක්‍රිය සන්නිවේදනයකට හේතුවන බවත් සන්නිවේදන කාර්යය වේගවත් වීමට ඉවහල් වන බවත් වෙබ් අඩවි ජනප්‍රිය විම ඉහළ යාමට හේතුවී තිබෙන බව කිව යුතුය.

## ආශ්‍රිය ග්‍රන්ථ


1. සුරියගොඩ, ලක්මාල් (2011) කුණු හරුප වෙබ් අඩවි ගැන සොයයි.
   http://www.lankadeepa.lk/index.php/articles/1355 2011 අගෝස්තු 25,
2. ඩයස්, ගිහාන් ( දි.නැ.) තාක්ෂණය සඳහා සිංහල භාෂාව යොදා ගැනිමේ අභියෝග,
   http://www.siyabas.lk/sinhala_unicode_related_doc
3. ඇතුලත් මුදලි, කාලිංග (2010)ඇන්රොයිඩ තුළ සිංහල යුනිකෝඩ.
   http://sinhala.kalingasblog.com/2010/07/25/sinhala-unicode-on-android-google-nexus- one/ 2010-ජුලි 25,
4. http://www.socialbakers.com/search?query=srilanka
5. http://upload.wikimedia.org/wikipedia/commons/8/88/WebsitesByLanguagePieChart.svg